**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-----------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) තෙලිජ්ජවිල පුස්තකාල ගොඩනැගිල්ල සංවර්ධන වැඩ සටහනට අදාළ ණයහිමි ප්‍රතිපාදන හා ප්‍රාග්ධන වියදම් රු. 781,042 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) මාර්ගයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ලැබිය යුතු රු. 200,000 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ හිඟ දැන්වීම් පුවරු ගාස්තු වටිනාකම රු.94,890 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ඉන්ධන ගාස්තු රු. 37,706 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ රු.52,250,798 ක ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂ 16 ක එකතුව රු.1,570,742 ක් විය.

(අ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.16,234,661 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂ 18 ක එකතුව රු.1,008,425 ක් ඇතුළත්වී තිබුණි.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

---------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.114,167,156 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.4 අනුකූල නොවීම්**

--------------------

**1.3.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපළ තහනම් කිරීමේ වරෙන්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (iii) රීති 199 | පොදු ගබඩා හා විදුලි ගබඩා තොග ලේඛනවල ලැබීම් සටහන් කරනු ලබන පැත්තේ ඇති සෑම සටහනක්ම ඉදිරියෙන් භාණ්ඩ සඳහා මුදල් ගෙවන ලද වවුචරයේ අංකය හා දිනය සටහන් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වසර 02 ක කාලය ඉකුත් වූ රු. 574,409 ක් වටිනා තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 10.1 උපවගන්තිය හා රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2013 ඔක්තෝබර් 09 දිනැති අංක 21/2013 දරන චක්‍රලේඛය. | කොන්දේසිවලට අනුකූල නොවන අයුරින් නිලධාරින් 03 දෙනෙකු වෙනුවෙන් දින 90 ක් සඳහා නිවාඩු දින වැටුප් ලෙස රු.126,823 ක මුදලක් ගෙවා තිබුණි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,520,472 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,200,750 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,449,000 | 1,261,776 | 1,212,335 | 133,099 | 1,288,900 | 1,206,262 | 1,223,665 | 83,658 |
| කුලී | 2,963,600 | 1,676,617 | 1,674,117 | 95,728 | 1,463,100 | 1,633,935 | 1,662,235 | 93,228 |
| බලපත්‍ර ගාස්තු | 632,000 | 457,734 | 457,734 | 16,800 | 460,000 | 590,255 | 590,255 | 16,800 |
| වෙනත් ආදායම් | 18,509,700 | 20,898,757 | 9,554,261 | 39,258,043 | 14,546,300 | 18,613,941 | 2,598,450 | 27,913,547 |
| -එකතුව- | 23,554,300 | 24,294,884 | 12,898,447 | 39,503,670 | 17,758,300 | 22,044,393 | 6,074,605 | 28,107,233 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

----------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.23,554,300 ක් වූ අතර බිල් කළ ආදායම රු.24,294,884 ක් විය. රු. 28,107,233 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.52,402,117 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.12,898,447 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.39,503,670 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

-------------------

(අ) වරිපනම්

----------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ වරිපනම් බදු ශේෂය රු.73,080 ක් වූ අතර, රු.149,512 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.222,592 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.101,222 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.121,370 ක් හිඟව පැවතුණි.

(ආ) අක්කර බදු

-------------

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු මුදල රු.8,052 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.4,514 ක් සමග රු. 12,566 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.837 ක් වීම නිසා වර්ෂය අවසානයට රු. 11,729 ක් හිඟව පැවතුණි.

**2.2.4 කුලී**

-----

ආරම්භක හිඟය රු.93,228 ක් වූ අතර, රු.1,421,568ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,514,796 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.1,419,068 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.95,728 ක් හිඟව පැවතුණි. ආරම්භක හිඟ ශේෂයෙන් කිසිදු මුදලක් අයවී නොතිබුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,440,112 ක් හා මුද්දර ගාස්තු රු.37,817,931 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කාර්ය සාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම (output) ලබා නොගැනීම**

--------------------------------------------------------------

(i) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයට අනුව සහා අරමුදලෙන් රු.11,000,000 ක සංවර්ධන වැඩ යෝජනා 31 ක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදී තිබුණද, වැඩ යෝජනා 30 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන යටතේ මාලිම්බඩ පොළ භූමියේ අන්තර් සම්බන්ධිත කුට්ටිගල් අල්ලා අළුත්වැඩියා කිරීම සඳහා 2017 වර්ෂයේ රු.2,000,000ක් අනුමත වී තිබූ අතර, අදාළ ව්‍යාපෘතිය ඉටු නොකිරීම නිසා මුදල් ආපසු යවා තිබුණි.

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සේවකයන් 08 දෙනෙකු බඳවා ගෙන තිබුණු අතර එක් සේවකයෙකුගේ පුරප්පාඩුවක් පැවතුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2014 මාර්තු 31 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2014 ප්‍රකාරව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියකින් තොරව බඳවාගෙන තිබූ අනියම්, කොන්ත්‍රාත් හා ආදේශක පදනම මත වූ සේවකයන් 05 දෙනකු සඳහා 2017 වර්ෂයේ වැටුප් ලෙස රු.2,302,373 ක මුදලක් ගෙවා තිබුණි.

(ඇ) සභාවේ සෞඛ්‍ය කම්කරුවන් 09 දෙනෙකු සේවයේ යොදවා තිබියදී වයස අවුරුදු 60 ඉක්මවූ සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු අනියම් පදනම මත යොදවා ගෙන 2017 වර්ෂය තුළ රු.442,680 ක මුදලක් ගෙවා තිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

-----------------------------

**නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දකුණු පළාත් සභාවට අයත්, හමුදා සේවයට රැගෙන ගොස් 2010 වර්ෂයේදී නැවත සභාවට භාරදී තිබූ භාවිතා කළ කැබ් රථයක් ගර්හිතව සහා භූමියේ ගාල් කර තිබුණි.

(ආ) මාලිම්බඩ පොළ ඉදිකිරීම සඳහා දකුණු පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2016 නොවැම්බර් 11 දින රු.3,420,704 කට කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම්ගත වී සියළු අධීක්ෂණ කටයුතු සභාවට පවරා තිබුණි. නියමිත දිනට සභාව විසින් බිල්පත් ඉදිරිපත් නොකිරීම නිසා වෙන්කල මුදලින් රු.2,199,907ක මුදලක් උපයෝජනය කිරීමට නොහැකි වී තිබූ අතර, රු.1,800,093 ක මුදලක් වැය කර ඉදිකර තිබූ පොළ ගොඩනැගිල්ලේ බිම් මහල වසරකට වැඩි කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව පැවතුණි. මේ නිසා පොළ පැවැත්වීම සඳහා පෞද්ගලික භූමියක් බදුගෙන 2017 වර්ෂය තුල රු.120,000 ක මුදලක් බදු වශයෙන් ගෙවා තිබුණි.

## 3.4 අවිධිමත් ගනුදෙණු

----------------------

පළාත් පාලන කොමසාරිස්ගේ 1997 ඔක්තෝබර් 29 දිනැති දපපා/07/මිශ්‍ර ලිපිය මගින් අත්‍යවශ්‍ය සේවාවල රාජකාරි කිරීම සඳහා මසකට පැය 80 ක් අතිකාල අනුමත කිරීමට සභාවේ ලේකම්ට බලය දී තිබුණි. ලේකම්වරිය විසින් එකම සේවකයකුට මුර සේවය හා ක්ෂේත්‍ර කම්කරු වශයෙන් රාජකාරි දෙකක් සඳහා පත්වීමක් ලබාදී අනුමත සීමාව ඉක්මවා පැය 1037.5 ක් සේවය කිරීම වෙනුවෙන් අතිකාල ලෙස රු.71,429 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.5 ආර්ථික නොවූ ගනුදෙනු

-----------------------------

2016 දෙසැම්බර් 30 දින රු.1,245,000 කට මිලදී ගෙන තිබූ ට්‍රැක්ටරයේ යාන්ත්‍රික දෝෂ පවතින බව, 2017 අගෝස්තු 23 දින හා නොවැම්බර් 10 දින මිලදී ගත් සමාගමට දැනුම් දී තිබුණි. වසර 02 ක වගකීම් කාලයක් සහිතව මිලදී ගෙන තිබූ මෙම රථය අදාළ සමාගමට දන්වා හුවමාරු කර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර, 2017 වර්ෂය තුළ ට්‍රැක්ටරය පැය 02 ක් පමණක් ධාවනය කර තිබූ බැවින් වැය කරන ලද මුදලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**--------------------------------------**

## 4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 08 ක රු.15,790,011 ක ඉතිරිවීම් තිබුණි. එම අගයයන් සියයට 21 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 05 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව රු.5,623,123 ක් වූ අතර, එම අගයන් සියයට 13 සිට 43 අතර පරාසයක පැවතුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

අභ්‍යන්තර විගණනය පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී, විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමටද පියවර ගෙන නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.4 නොවිසඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

-----------------------------------------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු අක්කර 09 රූඩ් 01 පර්චස් 36 ක් වූ ඉඩම් කැබලි 10 ක් නිෂ්ක්‍රීයව පැවති අතර, සභාව සතු අක්කර 25 පර්චස් 18 කින් යුත් ඉඩම් කැබලි 38 ක මායිම් ලකුණු කර ආරක්ෂා කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබීම.

(ආ) සභාව විසින් මිලදී ගෙන තිබූ රු. 175,644 ක් වටිනා කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය 2012 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව තිබීම.

(ඇ) සභාව සතු පිරිවැය රු.7,967,144 ක් වූ ගල් රෝල පැයට රු.1,500 ක් බැගින් පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට බදු දීම නිසා අයවිය යුතු රු.105,000 ක මුදල සභාවට අයවී නොතිබීම.

(ඈ) මාලිම්බඩ අලවත්තහේන පොදු සුසාන භූමිය ඉදි කිරීම නවතා තිබියදී කොන්ත්‍රාත්කාර සමාගම වෙත රු. 100,000 ක් ගෙවා වසර 18 ක් ගත වී තිබුණද, එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට සභාව කටයුතු කර නොතිබීම.

(ඉ) ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා ඉඩම් 02 ක් ලබාගෙන තිබූ නමුත් එක් ඉඩමක හෝ ආදාහනාගාරයක් ඉදි කර ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් සැපයීමේ අවශ්‍යතාවය ඉටුකර දීම කෙරෙහි සභාවේ අවධානය යොමු කර නොතිබීම.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ගිණුම්කරණය